# විශ්වවිද්‍යාලයීය වෘත්තීය සමිති ඒකාබද්ධ කමිටුව
# University Trade Union joint Committee


**සම සභාපතිවරු**
එඩ්වඩ් මල්වත්තගේ
පේරාදෙණිය විශ්වවිද්‍යාලය
පේරාදෙණිය.
075-8899200
077-9045553

බී.කේ.ඒ. ඩයස් විජය කුමාර
මානව ශාස්ත්‍ර පීඨය
කැළණිය විශ්වවිද්‍යාලය
071-4458552

**සම ලේකම්වරු**
පී.එච්.ඩී.එස්. ප්‍රියන්ත
වි.වි.ප්‍ර. කොමිෂන් සභාව
අංක 20, වෝඩ් පෙදෙස
කොළඹ 07. 071-4450507

පී.කේ. රුවන් කුමාර
වෛද්‍ය මධ්‍යස්ථානය
පේරාදෙණිය විශ්වවිද්‍යාලය
පේරාදෙණිය.
081-2392022

**භාණ්ඩාගාරික**
කේ.එල්.ඩී.ජී. රිච්මන්ඩ්
ශ්‍රීපාලි මණ්ඩපය
කොළඹ විශ්වවිද්‍යාලය
071-1998844

**සම්බන්ධීකරණ ලේකම්**
පී.ටී.ජේ. ජශෝදන්
යාපනය විශ්වවිද්‍යාලය
077-7040041



**Joint Presidents**

Edward Malwattage
University of Peradebiya
075-8899200
077-9045553

B.K.A. Dias Vijaya Kumara
Faculty of Humanities
University of Kelaniya
071-4458552

**Joint Secretaries**

P.H.D.S. Priyantha
UGC, Colombo 7
071-4450507

P.K. Ruwan Kumara
Medical Center,
University of Peradeniya
081-2392022

**Treasure**
K.L.D.G. Richmand
Sripalee Campus
University of Colombo
071-1998844

**Coordinating Secretary**

PTJ. Jashothan
University of Jaffna
077-7040041


**Joint Universities**

Colombo
Peradeniya
Kelaniya
Sri Jayawardanepura
Moratuwa
Jaffna
Ruhuna
Open University
Eastern
Rajarata
Sabaragamuwa
Wayamba
South Eastern
Uwa Wellassa
Visual & Performing Arts

2017පෙබරවාරි 01 වන දින.

අධි නිතිඥ ලක්ෂමන් කිරිඇල්ල මැතිතුමා
උසස් අධ්‍යාපන හා මහා මාර්ග ගරු අමාත්‍ය
උසස් අධ්‍යාපන හා මහා මාර්ග අමාත්‍යාංශය
බත්තරමුල්ල.

ගරු අමාත්‍යතුමණි,

<u>විශ්වවිද්‍යාලයීය අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ වෘත්තීය ගැටළු විසදා ගැනීම සම්බන්ධව පැමිණි එකඟතා ගිවිසුම බලාත්මක කර ගැනීම</u>

විශ්වවිද්‍යාල අනධ්‍යයන කාර්ය මණ්ඩලයට සෘජුවම බලපාන්නා වූ වෘත්තීය ගැටළු 07 ක් මුල්කර ගනිමින් ජාතික විශ්වවිද්‍යාල පද්ධතිය තුල ක්‍රියාත්මක වූ වෘත්තීය අරගලය ගරු අමාත්‍යතුමාගේ හා ගරු රාජ්‍ය අමාත්‍යතුමාගේ මැදිහත් වීමෙන් උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශයේ ලේකම්තුමා හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිතුමා විසින් අත්සන් කර ලබා දෙන ලද එකඟතා ලිපිය පදනම් කර ගනිමින් 2016 අගෝස්තු මස 08 වන දින මාධ්‍ය සාකච්ඡාවක් පැවැත්වීමෙන් අනතුරුව තාවකාලිකව අත්හිටවන ලදි.

ඒ අනුව ප්‍රධාන ඉල්ලීම වූ මාසික හිලව් දීමනාව සම්බන්ධ ගැටළුව විසදීම සඳහා ආරම්භයක් ලෙස <u>2017 ජනවාරි මස සිට ගෙවීම සඳහා රු. මිලියන 460 ක මුදලක් ලබාදීමට එකඟතාවයකට එළඹුණි.</u>

එම මුදල් 2017 ජනවාරි මස වැටුපට ලබාගැනීමේ දැඩි බලාපොරොත්තුවකින් විශ්වවිද්‍යාල අනධ්‍යයන සේවක ප්‍රජාව බලා සිටියද, එය ඉටුනොවූ අතර 2017 ජනවාරි මාසය නිමාවන තුරුත් ඊට අදාල චක්‍ර ලේඛය නිකුත් කිරීමට අදාල ලිපිය මුදල් අමාත්‍යාංශය මගින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත එවීමට කටයුතු කර නොමැත.

මෙම තත්වය මත රජය විශ්වවිද්‍යාල සේවක ප්‍රජාව රැවටීමට කටයුතු කර ඇති බවට ව්‍යාප්ත වන අදහස නිසා විශ්වවිද්‍යාල සේවක ප්‍රජාව තුල කලකිරීම හා දැඩි නොසන්සුන්තාවයක් නිර්මාණය වී ඇති බැවින්, ඔවුන්ගේ බලපෑම මත වෘත්තීය සංවිධාන ලෙස අපටද තවදුරටත් නිහඬව සිටීමට හැකියාවක් නොමැත.

එබැවින් 2017 ජනවාරි මස 31 වන දින රැස්වූ විශ්වවිද්‍යාලයීය වෘත්තීය සමිති ඒකාබද්ධ කමිටුව, එකඟතාවයන් ක්‍රියාත්මක නොවීම හා විශ්වවිද්‍යාල තුල නිර්මාණය වී ඇති නොසන්සුන් තත්වය පිලිබඳව දීර්ඝ ලෙස සාකච්ඡා කිරීමෙන් අනතුරුව පහත සඳහන් තීරණයන්ට එළඹුණි. එනම්,

1. එකඟතාවයන් කඩකිරීමට විරෝධය පා 2017 පෙබරවාරි මස 07 වන දින සේවයෙන් ඉවත්ව එක්දින වැඩවර්ජනයක් පැවැත්වීම.

2. ඉන් අනතුරුවද එකඟතාවයන් ක්‍රියාත්මක නොකරන්නේ නම් 2017 පෙබරවාරි 15 වන දින සිට තාවකාලිකව අත්හිටවූ අඛණ්ඩ වෘත්තීය ක්‍රියාමාර්ග නැවතත් ක්‍රියාත්මක කිරීම.

ගරු අමාත්‍යතුමනි, මෙවැනි තත්වයක් නැවතත් විශ්වවිද්‍යාල පද්ධතිය තුල නිර්මාණය වීම අප දෙපාර්ශවයම දැඩි අපහසුතාවයට පත්වීමකි. මක්නිසාදයත්, පැවති වෘත්තීය ක්‍රියා මාර්ගය තුල ආරම්භයක් ලෙස රුපියල් මිලියන 460 ක් ලබා ගැනීමට දැඩි පරිශ්‍රමයක් දරා සේවක ප්‍රජාව එකඟකරගත් අතර එළඹි එකඟතාවයන් කඩවීම තුල හෙට දවසේ එසේ කලහැකි වෙතයි සිතීම අපහසුය.

එබැවින් නැවතත් විශ්වවිද්‍යාල පද්ධතිය තුල අර්බුදකාරී තත්වයක් නිර්මාණය වීමට පෙර ඔබතුමන්ලාගේ දැඩි උනන්දුව හා මැදිහත්වීම මත දැනටමත් වෙන්කර ඇතැයි පවසන රු.මි. 460 ක මුදල ලබා දීමට අදාල මුදල් අමාත්‍යාංශ ලිපිය මෙම සතිය තුල නිකුත් කර 2017 ජනවාරි මස සිට ක්‍රියාත්මක වන පරිදි එම දීමනාව 2017 පෙබරවාරි මස වැටුපට ගෙවීමට හැකිවන පරිදි අදාල චක්‍රලේඛ නිකුත් කිරීමට අවශ්‍ය කටයුතු කරන මෙන් ඉතා ඕනෑකමින් ගෞරවයෙන් ඉල්ලා සිටිමු.

ස්තුතියි !

මෙයට,
ඒකාබද්ධ කමිටුවේ නියමය පරිදි,

(පී.එච්.ඩී.එස්. ප්‍රියන්ත/පී.කේ. රුවන් කුමාර)
සම ලේකම්වරු

(එඩ්වඩ් මල්වත්තගේ /බී.කේ.ජී. ධයස් විජයකුමාර)
සම සභාපතිවරු

පිටපත් :-
ගරු රජ්‍ය අමාත්‍ය මොහාන් ලාල්ග්‍රේරු මැතිතුමා
ලේකම් / උසස් අධ්‍යාපන හා මහා මාර්ග අමාත්‍යාංශය
සභාපති / වි.ප්‍ර.කො.ස
උප සභාපති / වි.ප්‍ර.කො.ස
ලේකම් / වි.ප්‍ර.කො. ස
විශ්වවිද්‍යාල උපකුලපතිවරු/ආයතන අධ්‍යක්ෂකවරු/ මණ්ඩපාධිපතිවරු/ ලේඛකාධිකාරීවරු/ නියොජ්‍ය ලේඛකාධිකාරීවරු
සහකාර ලේකම් - වෘත්තීය සමිති කටයුතු / උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය
වෘත්තීය සමිති සභාපතිවරු/ ලේකම්වරු